# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2356/29 - 2023 නොවැම්බර් මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2023.11.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ජනා.කා.අංකය : පීඑස්/සීඑස්ඒ/00/4/7/1

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපති**
**රනිල් වික්‍රමසිංහ මැතිතුමන් විසිනි**

මුද්‍රාව

රනිල් වික්‍රමසිංහ

විශ්‍රාමික අගවිනිසුරු ජනාධිපති නීතිඥ ගරු වැවගේ ප්‍රියසත් ජෙරාර්ඩ් ඩෙප් මැතිතුමා
සුන්දරම් අරුමෙනායගම් මැතිතුමා
සේනානායක අලිසැන්ඩ්‍රලාගේ මැතිතුමා
ජනාධිපති නීතිඥ නලින් ජයන්ත අබේසේකර මැතිතුමා
රජිත නවීන් ක්‍රිස්ටෝපර් සේනාරත්න පෙරේරා මැතිතුමා
අහමඩ් ලෙබ්බෙ මොහොමඩ් සලීම් මැතිතුමා
සාගරිකා දෙල්ගොඩ මැතිතුමිය
එස්තර් ශ්‍රියාණි නිමල්කා ප්‍රනාන්දු මැතිතුමිය
විතාරණගේ දීපානි සමන්ත රොඩ්රිගෝ මැතිතුමා

වෙත,

ශුභාශිංසන පූර්වකවයි!

1948 අංක 17 දරන පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි 2 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති රනිල් වික්‍රමසිංහ වන මවිසින්, 2023 ඔක්තෝබර් මස 15 වන දිනැති අධිකාරී පත්‍රය මගින් පවත්නා මැතිවරණ නීති පිළිබඳව පරීක්ෂා කර බලා මැතිවරණ නීති සංශෝධනය කිරීමට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම, දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම්


1A - G 40656 — 361 (2023/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

විසින් නිසි පරිදි මාධ්‍ය භාවිතා කළ යුතු ආකාරය පිළිබඳව මාධ්‍ය උපමාන සකස් කිරීම පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම, දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් හා ඔවුන්ගේ සාමාජිකත්වය දේශපාලන හා පොදු කටයුතු ඉටුකිරීමේදී හැසිරිය යුතු ආකාරය සම්බන්ධව චර්යාධර්ම පද්ධතියක් හඳුන්වාදීම පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම, දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීම සහ විශ්වාසනීයව හා මහජනතාවට වගකියන අයුරින් ඒවායෙහි කටයුතු කිරීම සම්බන්ධව නීති රීති ශක්තිමත් කිරීම පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම පිළිබඳව තොරතුරු ලබා ගැනීම, විමර්ශනය සහ පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා වන කොමිෂන් සභාවට ඔබතුමන්ලා පත්කරනු ලැබ ඇති හෙයින් ද;

තවද, ජනතාවගේ දේශපාලන මතයන් ගොඩනැගීමට සහභාගි වෙමින් පුරවැසියන් සහ රාජ්‍යය අතර අතරමැදි කාර්යභාරයක් ඉටු කරන බැවින්, බහු පක්ෂ ප්‍රජාතන්ත්‍රවාදය පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය සඳහා අත්‍යවශ්‍ය යටිතල ව්‍යුහයක් වන හෙයින් ද;

තවද, 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති පරිදි ජනතාවගේ ඡන්ද බලය ක්‍රියාත්මක කිරීම සඳහා විශ්වසනීය වූ දේශපාලන පක්ෂ පූර්ව අවශ්‍යතාවක් වන හෙයින් ද;

තවද, මැතිවරණද ඇතුළත්ව මැතිවරණ ව්‍යාපාරයන්හි මූල්‍ය පිරිවැය සීඝ්‍රයෙන් ඉහළ යාම දේශපාලනය තුළ මුදලෙහි භූමිකාව සහ ප්‍රතිපත්ති ග්‍රහණයට ඇති අවස්ථාවන් සම්බන්ධයෙන් අවධානය ඉහළ යාමට හේතු වී ඇති හෙයින් ද;

තවද, අපරාධවලට සම්බන්ධ වූවන් දේශපාලන පක්ෂවලට ඇතුළු වීම පිළිබඳ අවධානය ඉහළ ගොස් ඇති හෙයින් ද;

තවද, ස්ථාවර දේශපාලන පක්ෂ වෙනුවට දේශපාලන අස්ථාවරභාවයට තුඩු දෙන පරිදි කෙටි කාලීන දේශපාලනික පෙරමුණු ආදේශ වෙමින් පවතින හෙයින් ද;

තවද, ශ්‍රී ලංකාවේ ඡන්දදායකයා සහ දේශපාලන පක්ෂ අතර අන්‍යෝන්‍ය විශ්වාසයක් තහවුරු කර පවත්වාගෙන යාම සෑම විටම අවශ්‍ය වන හෙයින් ද;

තවද, දේශපාලන පක්ෂ සඳහා පිළිගැනීමක් ලබා දීම සහ ඒවා අවලංගු කිරීම සඳහා නීතිමය නිර්ණායක ස්ථාපිත කිරීමද ඇතුළත්ව වෙනත් රටවල නීති සහ භාවිතයන් සැලකිල්ලට ගෙන, ඡන්දදායකයින් වෙත දේශපාලන පක්ෂවල විනිවිදභාවය සහ වගවීම තහවුරු කිරීමටත්, එමගින් ජනතා විශ්වාසය නැවත ඇති කර ගැනීම සඳහාත් ප්‍රතිසංස්කරණ අවශ්‍ය වන හෙයින් ද;

තවද, අන්තර් පාර්ලිමේන්තු සංගමයද ඇතුළත්ව ගෝලීය වශයෙන් පිළිගත් සංවිධාන ගණනාවක් විසින් දේශපාලන පක්ෂවල විනිවිදභාවය සහ වගවීම සඳහා නිර්ණායක නිශ්චය කර ඇති හෙයින් ද;

තවද, 2023 ඔක්තෝබර් මස 16 දිනැති අංක 2354/06 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරන ලද,පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි 2 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව,අධිකාරී පත්‍රය මගින් පත්කරන ලද ඉහත කී කොමිෂන් සභාවේ විෂයය ක්ෂේත්‍රය තවදුරටත් පුළුල් කළ යුතු බව මවිසින් අදහස් කරනු ලබන හෙයින් ද;

තවද, මෙම කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යය භාරය වැඩිවීමත් සමගම එහි කාර්යයන් වඩාත් කඩිනමින් සහ කාර්යක්ෂමව සපුරාලීම පිණිස දැනට ධුර දරන කොමසාරිස්වරුන්ගේ සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බව මවිසින් හඳුනාගනු ලැබ ඇති හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති රනිල් වික්‍රමසිංහ වන මම, පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 3 වන වගන්තියේ විධිවිධානයන්ට අනුකූලව ඇලන් කාමයිකල් වියර් ඩේවිඩ් මැතිතුමා, ඔබතුමාගේ විචක්ෂණභාවය, සාමාර්ථය හා විශ්වාසවන්තභාවය කෙරෙහි මහත්වූ භක්තිය හා විශ්වාසය තබමින්, ඉහත කී අධිකාරී පත්‍රය ප්‍රකාර ස්ථාපනය කරනු ලැබූ පරීක්ෂණ කොමිෂන් සභාවේ කොමසාරිස්වරයෙකු ලෙස මෙයින් පත් කරමි.

තවද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති රනිල් වික්‍රමසිංහ වන මම, සංශෝධිත 1948 අංක 17 දරන පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි 2 වන සහ 3 වන වගන්තිවල විධිවිධාන ප්‍රකාරව පත්කරන ලද ඉහත කී කොමිෂන් සභාවේ කොමසාරිස්වරුන් වන ඉහත කී,

1. විශ්‍රාමික අගවිනිසුරු ජනාධිපති නීතිඥ ගරු වැවගේ ප්‍රියසත් ජෙරාර්ඩ් ඩෙප් මැතිතුමා
2. සුන්දරම් අරුමෙනායගම් මැතිතුමා

3. සේනානායක අලිසැන්ඩ්‍රලාගේ මැතිතුමා
4. ජනාධිපති නීතිඥ නලින් ජයන්ත අබේසේකර මැතිතුමා
5. රජිත නවීන් ක්‍රිස්ටෝපර් සේනාරත්න පෙරේරා මැතිතුමා
6. අහමඩ් ලෙබ්බෙ මොහොමඩ් සලීම් මැතිතුමා
7. සාගරිකා දෙල්ගොඩ මැතිතුමිය
8. එස්තර් ශ්‍රියාණි නිමල්කා ප්‍රනාන්දු මැතිතුමිය
9. විතාරණගේ දීපානි සමන්ත රොඩ්රිගෝ මැතිතුමා
10. ඇලන් කාමයිකල් වියර් ඩේවිඩ් මැතිතුමා

වන ඔබතුමන්ලා වෙත මතු දැක්වෙන කරුණු පිළිබඳව තොරතුරු ලබා ගෙන ඉදිරිපත් කිරීමටත්, විමර්ශනය සහ පරීක්ෂා කර වාර්තා කිරීමටත් මෙයින් නියම කරමි.

එකී කරුණු කවරේද යත්;

01. පවත්නා සියලුම මැතිවරණ නීති රීති පිළිබඳව පරීක්ෂා කර බලා පහත සඳහන් කරුණු වලට ද විශේෂ අවධානයක් යොමුකරමින් කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි මැතිවරණ නීති සංශෝධනය කිරීමට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.

    i. කාන්තා හා තරුණ නියෝජනය වැඩිකිරීම.
    ii. මැතිවරණයක් ප්‍රකාශයට පත්කළ දින සිට එකී මැතිවරණය පවත්වා ප්‍රතිඵල නිකුත් කරනු ලබන දින දක්වා වන කාලය අඩුකිරීම.
    iii. ඡන්දය භාවිතා කිරීමේදී මුද්‍රිත ඡන්ද පත්‍රිකාවක් භාවිතා කිරීම වෙනුවට නවීන තාක්ෂණය යොදා ගනිමින් ඉලෙක්ට්‍රොනිකව ඡන්දය භාවිතා කිරීම සඳහා අවස්ථාව සැලසීම.
    iv. විදේශගත ශ්‍රී ලාංකිකයින්ට ඡන්දය භාවිතා කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය.
    v. එකම පුද්ගලයෙකුට, මහජන නියෝජිතයින් තෝරා ගැනීම සඳහා පළාත් සභා සහ පාර්ලිමේන්තු යන මැතිවරණ දෙකටම තරග කිරීමට සහ එකී පළාත් සභා සහ පාර්ලිමේන්තු යන මැතිවරණ දෙකෙහිදීම තේරී පත්වුවහොත්, එකවර අදාළ සභා දෙකම නියෝජනය කිරීමට, අවස්ථාව ලබාදීම(උදා: පාර්ලිමේන්තුවට තේරී පත්ව ඇති පුද්ගලයෙකුට පළාත් සභා මැතිවරණයට තරග කිරීමට අවස්ථාව ලබා දී එයටද තේරී පත්වුවහොත් එකවර පළාත් සභාව සහ පාර්ලිමේන්තුව යන සභා දෙකම නියෝජනය කිරීමට අවස්ථාව ලබාදීම).
    vi. මැතිවරණ දිනයේදී මැතිවරණ කටයුතු වෙනුවෙන් සේවාවන් සපයනු ලබන රාජ්‍ය සංස්ථා/ රාජ්‍ය ව්‍යාපාර/ පෞද්ගලික අංශයේ සේවයේ නියුතු ඡන්ද දායකයින්ටද තැපැල් ඡන්දය භාවිතා කිරීම සඳහා අවස්ථාව ලබාදීම.
    vii. මහජන නියෝජිතයින් තෝරා ගැනීම සඳහා සමානුපාතික නියෝජන ක්‍රමයට පමණක් සීමා නොවී සමාජයේ බහුත්ව ස්වරූපය සැලකිල්ලට ගෙන එම බහුත්ව ලක්ෂණද නියෝජනය වන පරිදි කේවල ක්‍රමයද සමග සම්මිශ්‍රණය වූ සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීම.

02. දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් විසින් නිසි පරිදි මාධ්‍ය භාවිතා කළ යුතු ආකාරය පිළිබඳව මාධ්‍ය උපමාන සකස් කිරීම පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම.

03. දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් හා ඔවුන්ගේ සාමාජිකත්වය දේශපාලන හා පොදු කටයුතු ඉටුකිරීමේදී හැසිරිය යුතු ආකාරය සම්බන්ධව චර්යාධර්ම පද්ධතියක් හඳුන්වාදීම පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම.

04. දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීම සහ විශ්වාසනීයව හා මහජනතාවට වගකියන අයුරින් ඒවායෙහි කටයුතු කිරීම සම්බන්ධව නීති රීති ශක්තිමත් කිරීම පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම.

05. යෝජිත ව්‍යවස්ථාවද ඇතුළත්ව පහත කරුණු පිළිබඳව නිර්දේශයන් ඉදිරිපත් කිරීම;

    i. අනෙකුත් බහු පක්ෂ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන්ට සමාන වන පරිදි පිළිගත් සහ ස්ථාවර දේශපාලන පක්ෂ මත පදනම්ව ශ්‍රී ලංකාවේ බහු පක්ෂ ක්‍රමය ශක්තිමත් කිරීම
    ii. දේශපාලනය තුළ මුදලෙහි භූමිකාව සහ ප්‍රතිපත්ති ග්‍රහණය වැළැක්වීම මෙන්ම දේශපාලන පක්ෂ සඳහා මහජන අරමුදල් සැපයීම.
    iii. දේශපාලන පක්ෂ සාමාජිකයින් වෙත නායකත්වයේ වගවීම

iv. මැතිවරණ ව්‍යාපාර කටයුතු සඳහා දරනු ලබන වියදම් අඩු කිරීම
v. සියලු ජන කොටස් අතර සහයෝගීතාව සහ අන්‍යෝන්‍ය විශ්වාසය ප්‍රවර්ධනය කරමින් ජාතික සමගිය ශක්තිමත් කිරීම සඳහා දේශපාලන පක්ෂවල කාර්යභාරය
vi. පහත සඳහන් කරුණු අරමුණු වශයෙන් තබාගනිමින්, ප්‍රතිපත්ති මත පදනම් වූ දේශපාලන පක්ෂ ප්‍රවර්ධනය කිරීම

*අ.* ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය සහ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම
*ආ.* දේශපාලන හා ආර්ථික ස්ථාවරත්වය
*ඇ.* ශ්‍රී ලාංකික අනන්‍යතාවය සහ
*ඈ.* සංවර්ධිත ආර්ථිකයක් බවට පරිවර්තනය කිරීම තුළින් ජනතාවගේ සමාජ හා ආර්ථික තත්ත්වයන් ඉහළ නැංවීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් විසිතුනක් වූ නොවැම්බර් මස 02 දින කොළඹ දී දෙන ලදී.

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඊ. එම්. එස්. බී. ඒකනායක,
ජනාධිපති ලේකම්.

EOG 11 - 0026

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.